# සාමාන්‍ය සමයේ දස අටවන සතිය
# සඳුදා

## පළමුවන කියැවීම

ගණන් කතාවෙන් ගත් පාඨයෙකි.

ගණන් කතාව 11: 4-15

"මුළු සෙනඟ ගැන වගකීම මට තනිව දැරීමට බැරිය."

ඉශ්‍රායෙල් ජනයා අතර සිටි විදේශීහු කෑම තණ්හාවට වසඟ වූහ. ඉශ්‍රායෙල් ජනයා පවා හඬන්නට පටන් ගෙන, "අපට කෑම මස් දෙන්නේ කවුද? අප මිසර දේශයේ දී නොමිලයේ කෑ මාලු ද පිපිඤ්ඤා, කොමඩු, ලීක්ස්, රතු ළූණු හා සුදු ළූණු ද අපට මතක ය. දැන් නම් අපි හෙම්බත් වී සිටිමු. අපේ ඇහැට පෙනෙන මන්නා ආහාරය හැර වෙන කිසිවක් අපට නැතැ"යි කීවෝය.

මන්නා, කොත්තමල්ලි ඇට මෙන් විය. එහි පැහැය සුවඳලාටු මෙන් විය. සෙනඟ ඔබ මොබ ගොස් ඒවා රැස් කොට, ගලෙන් අඹරා හෝ වංගෙඩියේ ලා කොටා හෝ බඳුන්වල පිළියෙල කොට පූප සෑදූහ. එහි පිරිසිදු තෙලින් බැදූ පූපවල මෙන් රහක් තිබිණි. රාත්‍රියේ දී කඳවුරු මත පිණි වැටුණු විට, එය සමඟ මන්නා වැටිණි.

සෙනඟ ද පවුල් වශයෙන්, තම තමන්ගේ කූඩාරම් දොරකඩ සිට හඬනු මෝසෙස්ට ඇසිණි. සමිඳාණන් වහන්සේගේ කෝපය ද ඉමහත් ලෙස දැල්විණි. මෝසෙස් දුකට පත් විය.

ඔහු සමිඳාණන් වහන්සේට කතා කොට, “ඔබේ සේවකයාට ඔබ පීඩා කරන්නේ මන්ද? ඔබට මා අප්‍රසන්න වී ඇත්තේ කුමන හේතුවකින් ද? මේ මුළු සෙනඟ ගැන වගකීම ඔබ මට පවරා තිබෙන්නේ ඇයි? මම මේ මුළු සෙනඟ පිළිසිඳ නොගත්තෙමි. ‘ඔවුන්ගේ පියවරුන්ට පොරොන්දු වූ දේශයට කිරි මවක කිරි බොන දරුවෙකු උසුලාගෙන යන ලෙස, ඔවුන් ඔබේ තුරුල්ලේ රැගෙන යන්න’ කියා ඔබට මට කීමට ඇත්තෙන්ම ඔවුන් ජනිත කළේ මම ද? මේ මුළු සෙනඟට මා මස් කොහෙන් සොයා ගෙනැවිත් කන්න දෙන්න ද? ‘අපට කන්න මස් දෙන්නැ’යි කියා ඔව්හු මා ළඟ හඬමින් සිටිති. මුළු සෙනඟ ගැන වගකීම මට තනිව දැරීමට බැරිය. ඔබ මට මෙසේ කරන්නෙහි නම් කරුණාකර මා මරා දමනු මැනවි. එවිට මගේ කාලකණ්නිකම මට ම නොපෙනී යනු ඇතැ”යි කීවේ ය.

දේව වාක්‍යය එසේය.

## පිළිතුරු ගීය

ගීතාවලිය 81 : 11 – 16

පිළිතුර: අප ශක්තිය වන දෙවිඳුන්ට ප්‍රීති හඬ නගමු.

ගීය: “මාගේ සෙනඟ මාගේ හඬට සවන් නුදුන්නෝ ය.
ඉශ්රායෙල්වරු මට කීකරු නොවූහ.
ඔවුන්ගේ ගල් හිත නිසා මම ඔවුන් ප්‍රතික්ෂේප කළෙමි. එවිට ඔව්හු ඔවුන්ගේම මතිමතාන්තර අනුව ගමන් කළෝය.

මාගේ සෙනඟ මට සවන් දෙන්නෝ නම්, ඉශ්රායෙල්වරු මා අනුව එන්නෝ නම්, කොතරම් යහපත් ද?
එවිට මම ඔවුන්ගේ සතුරන් වහා පරාජය කරන්නෙමි.

ඔවුන්ගේ එදිරිකාරයන්ට විරුද්ධව මම පහර දෙන්නෙමි.

සමිඳුන් හට වෛර කරන්නෝ එතුමන් අබිමුව බියෙන් පැකිලෙන්නෝ ය. ඔවුන්ගේ විපත සදහට ම තිර වන්නේය.
එතුමාණෝ ඉස්තරම් ධාන්‍යයෙන් ඔබ පෝෂණය කරන සේක.
වන මී පැණියෙන් මම ඔබ සෑහීමට පත් කරන්නෙමි.”

## සාධුකාරය (දෙවසරේම)

ආලේලූයා! ආලේලූයා!
“මාර්ගය ද සත්‍යය ද ජීවනය ද මම වෙමි.
මා මගින් මිස කිසිවෙක් පියාණන් වහන්සේ වෙත
නොපැමිණෙන්නේ ය”යි සමිඳාණන් වහන්සේ වදාරන සේක.
ආලේලූයා!

නොහොත්

ආලේලූයා! ආලේලූයා!
“මිනිසා ජීවත් වන්නේ ආහාරයෙන් පමණක් නොව,
දෙවියන් වහන්සේගේ මුවින් නික්මෙන සියලු වචන වලින් ය” යි
සමිඳාණන් වහන්සේ වදාරන සේක.
ආලේලූයා!

# සුවිශේෂය

සුවිශේෂක මතෙව් තුමන් විසින් ලියන ලද දේව වාක්‍යය නම් මෙසේය.

මතෙව් 14: 13-21

"උන්වහන්සේ ස්වර්ගය දෙස බලා ආශිර්වාදය පවසා, රොටි කඩා ශ්‍රාවකයන්ට දුන් සේක."

ජේසුස් වහන්සේ නික්ම ඔරුවකින් හුදකලා තැනකට වෙන්ව වැඩිය සේක. ජනකාය ඒ අසා නුවරවලින් පිටත්ව අවුත් උන්වහන්සේ පසු පස්සේ පයින් ගියහ. උන්වහන්සේ ගොඩ බැස, විශාල ජනකායක් දැක, ඔවුන් කෙරෙහි අනුකම්පා කොට ඔවුන්ගේ රෝගීන් සුවපත් කළ සේක.

සවස් වූ කල ශ්‍රාවකයෝ උන්වහන්සේ වෙත අවුත්, "මෙය පාළු තැනකි. දැන් රෑ බෝ වී ඇත. ගම්වලට ගොස් කෑම මිලට ගන්නා පිණිස සමූහයා යන්නට හැරිය මැනවැ"යි කීහ. "ඔවුන් යවන්නට වුවමනාවක් නැත. ඔබ ඔවුන්ට කන්න දෙන්නැ"යි ජේසුස් වහන්සේ ඔවුන්ට වදාළ සේක. ඔව්හු ද "අප ළඟ මෙහි ඇත්තේ රොටි පහකුත් මසුන් දෙදෙනෙකුත් පමණකැ"යි උන්වහන්සේට කීහ. "ඒවා මෙහි මා වෙත ගෙනෙන්නැ"යි උන්වහන්සේ වදාළ සේක. තණ කොළ මත හිඳගන්නට ජනකායට අණ කොට, උන්වහන්සේ රොටි පහත්, මසුන් දෙදෙනාත් ගෙන ස්වර්ගය දෙස බලා ආශිර්වාදය පවසා, රොටි කඩා ශ්‍රාවකයන්ට දුන් සේක. ශ්‍රාවකයෝ ද එය සෙනඟට දුන්හ. හැම දෙනම කා තෘප්තියට පැමිණියහ. ඔව්හු ඉතිරි කැබලි එක්කොට කුඩ දොළොසක් පුරවා ගත්හ. ස්ත්‍රීන් හා දරුවන් හැර කෑම කෑ පුරුෂයෝ පන් දහසක් පමණ වූහ.

සුවිශේෂ වාක්‍යය එසේය.